# පිටබැද්දර ප්‍රාදේශීය සභාව
# මාතර දිස්ත්‍රික්කය

1 මූල්‍ය ප්‍රකාශන

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2014 මැයි 02 දිනද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2013 අප්‍රේල් 01 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2014 දෙසැම්බර් 29 දින සභාවේ සභාපතිවරයාට යවා ඇත

1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2013 දෙසැම්බර් 31 දිනට පිටබැද්දර ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.3.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

(අ) 2010 ජනවාරි 19 දිනැති අංක PED/54 දරන රාජ්‍ය ව්‍යාපාර අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ චක්‍රලේඛය අනුව 2011 ජනවාරි 01 දින සිට පළාත් පාලන ආයතන විසින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති වලට අනුව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළයුතු වුවත් එම ප්‍රමිති අනුගමනය කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සමඟ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය ඉදිරිපත් කර නොතිබුණි

1.3.2 ගිණුම්කරණ ප්‍රතිපත්ති

සමාලෝචිත වර්ෂය සඳහා ඉදිරිපත් කළ මූල්‍ය ප්‍රකාශන සමඟ එකී ගිණුම් පිළියෙල කිරීමේදී අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති හෙළිදරව්කර නොතිබුණි.

1.3.3 ගිණුම්කරණ අඩුපාඩු

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේදී මිලදී ගන්නා ලද රු.97,660 ක් වූ ලී බඩු හා කාර්යාල උපකරණ ප්‍රාග්ධනිත කර නොතිබුණි.

(ආ) සභාවට අයත් මාර්ග තලනය හා බැකෝ යන්ත්‍රය කුලියට ලබාදීමේදී අත්තිකාරමක් ලෙස ලබාගෙන තිබූ රු.22,500 ක මුදල සමාලෝචිත වර්ෂයේ අදාල අයශීර්ෂයට බැර කළයුතු වුවද, තැන්පත් ගිණුමට බැර කර තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේදී රු.3,176,922 ක් වූ සැපයුම් හා උපකරණ මිලට ගෙන තිබූ අතර එකී ද්‍රව්‍ය හා උපකරණ නිකුත් කිරීමේදී, අදාල වැය විෂයයන්ට නිකුත් කිරීම් පත්‍රිකා මගින් හර කර වියදම් විශ්ලේෂණයක් මගින් ගිණුම් ගතකළයුතු වුවද එසේ සිදු නොකර ආරම්භක තොගයට

ගැනුම් එකතු කොට අවසන් තොගය අඩුකළවිට ලැබෙන වටිනාකම වර්ෂයට අදාල වියදම ලෙස ආදායම් වියදම් ගිණුමට හර කර තිබුණි.

1.3.4 නොසැසඳූ පාලන ගිණුම්

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) ගිණුම් විෂයයන් 11 කට අදාල මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂයන්ගේ එකතුව රු.37,299,841 ක් වූ අතර උපයෝගී ලේඛන/උපලේඛන අනුව ගිණුම් ශේෂයන්ගේ එකතුව රු.30,539,889 ක් වූයෙන් වෙනස රු.6,759,952 ක් විය.

(ආ) 2013 දෙසැම්බර් 31 දිනට කර්මාන්ත ණයගැති ලේඛනය හා ඉදිරිපත් කර ඇති උප ලේඛනය අතර කර්මාන්ත 6 කට අදාලව රු.204,149 ක වෙනසක් විය.

1.3.5 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) 2013 දෙසැම්බර් 31 දිනට අවුරුදු 01 ක කාලයක් ඉක්මවා තිබූ ලැබිය යුතු ගිණුම් ශේෂවල වටිනාකම රු.1,555,015 ක් විය.

(ආ) 2013 දෙසැම්බර් 31 දිනට අවුරුදු 01 ක කාලයක් ඉක්මවා තිබූ ගෙවිය යුතු ගිණුම් ශේෂවල වටිනාකම රු.13,650,050 ක් විය.

1.3.6 විගණනය සඳහා සාක්ෂි නොවීම

රු.6,120,260 ක් වටිනා ගිණුම් විෂයයන් 04 ක් සම්බන්ධව සාක්ෂි විගණනයට ඉදිරිපත් නොකෙරිණි.

1.3.7 නීති, රීති , රෙගුලාසි ආදියට අනුකූල නොවීම

විගණනයේදී නිරීක්ෂණය වූ නීති, රීති, රෙගුලාසිවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති | |
| රීති 218 | ඉඩම් හා ගොඩනැගිලි සෑම වර්ෂයකට වරක් පරීක්ෂා කිරීමට සභාපතිවරයා විසින් කටයුතු කළයුතු වුවද එසේ කටයුතු කර නොතිබුණි. |
| (ආ) 2002 නොවැම්බර් 28 දිනැති අංක 2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | පරිඝනක උපාංග හා මෘදුකාංග සම්බන්ධයෙන් ස්ථාවර වත්කම් ලේඛනයක් නඩත්තු කර නොතිබුණි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.5,470,127 ක් වූ අතර එයට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.3,404,174 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂය සඳහා ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් විෂයයන් | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|
| | රු.000 | රු.000 | රු.000 |
| වරිපනම් හා බදු | 1,041 | 1,051 | 203 |
| කුලී | 4,593 | 3,062 | 1,016 |
| බලපත්‍ර ගාස්තු | 321 | 372 | 70 |
| වෙනත් ආදායම් | 18,830 | 23,698 | 10,810 |

#### 2.2.2 වරිපනම් බදු

2010 පෙබරවාරි මස 08 වන දින අංක 1641/41 දරන අති විශේෂ ගැසට් නිවේදනය මගින් සභා බල ප්‍රදේශයට අයත් ග්‍රාම නිලධාරී වසම් 04 ක් නාගරික සංවර්ධන අධිකාරී පනත ප්‍රකාරව දියුණු ප්‍රදේශ ලෙස ප්‍රකාශ කර තිබුණද එම ප්‍රදේශවල වරිපනම් බදු අය කිරීමට අදාල ඉදිරි කටයුතු ප්‍රාදේශීය සභාව විසින් ඉටු නොකිරීම හේතුවෙන් 2010 පෙබරවාරි මස සිට 2013 දෙසැම්බර් මස 31 වන දින වන විට එනම් වසර 04 ක පමණ කාලයක් වරිපනම් බදු ආදායමක් සභාවට අහිමිවී තිබුණි.

#### 2.2.3 අක්කර බදු

2013 ජනවාරි 01 දිනට අක්කර බදු හිඟ ශේෂය රු.193,444 ක් වූ අතර වර්ෂය සඳහා බිල්කිරීම් අධිගාස්තුද ඇතුළුව රු.30,303 ක් විය. බිල්කළ මුදලින් රු.7,592 ක්ද, හිඟ මුදලින් රු.12,415 ක්ද සමාලෝචිත වර්ෂයේදී අයකරගෙන තිබූ අතර අයවීමේ ප්‍රගතිය පිළිවෙලින් සියයට 25 ක් හා සියයට 6 ක් තරම් සුළු අගයක් ගෙන තිබුණි.

#### 2.2.4 ව්‍යාපාර බදු හා බලපත්‍ර ගාස්තු

ඉකුත් වර්ෂ කිහිපයක සිට ඉදිරියට එමින් පවතින රු.70,522 ක හිඟ වෙළඳ බලපත්‍ර ගාස්තු මුදල අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

2.2.5 ජල ගාස්තු

2013 ජනවාරි 01 දිනට හිඟහිටි ජල ගාස්තු රු.1,186,827 මුදලින් රු.501,259 ක් සමාලෝචිත වර්ෂයේදී අයකරගෙන තිබූ අතර අයවීමේ ප්‍රතිශතය සියයට 42 ක් විය.

2.2.6 උසාවි දඩ හා මුද්දර ගාස්තු

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් සමාලෝචිත වර්ෂය අවසානයට ලැබිය යුතුව තිබූ රු.9,590,429 ක උසාවි දඩ හා මුද්දර ගාස්තු මුදල් පහත දැක්වේ.

| | රු. |
|---|---|
| උසාවි දඩ | 2,738,612 |
| මුද්දර ගාස්තු | 6,851,817 |
| | 9,590,429 |

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

2005 මාර්තු 31 දිනැති 08/2005 දරන රාජ්‍ය පරිපාලන ලේකම්ගේ චක්‍රලේඛයේ 11.5 වගන්තිය අනුව දේපළ ණය සඳහා බැංකු පොලී අනුපාතය හා නිලධාරියාගෙන් අයකරන සියයට 4.2 ක පොලී අනුපාතය අතර වෙනස රජය විසින් ප්‍රතිපූර්ණය කළ යුතුය. එසේ වුවද 2013 දෙසැම්බර් 31 දිනට ප්‍රතිපූර්ණය නොවූ මුදල රු.237,517 ක් විය.

3.2 බලය නොළත් ගනුදෙනු

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 132(ඒ) වගන්තිය ප්‍රකාරව යම් ආගමික උත්සවයක් හෝ ප්‍රජා වැදගත්කමක් සහිත සංස්කෘතික, සෞඛ්‍ය, විද්‍යාත්මක හෝ අධ්‍යාපනික කාර්යක් සඳහා රු.1,000 ක වැඩි මුදලක් සභා අරමුදලින් වියදම් කරන්නේ නම් ඒ සඳහා අදාල අමාත්‍යවරයාගේ පූර්ව අනුඥාවක් ලබාගත යුතු වුවත් එවැනි අනුඥාවක් ලබා නොගෙන 2013 වසර තුලදී රු.192,194 ක මුදලක් වැයකර තිබුණි.

3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) අනියම්, ආදේශක, කොන්ත්‍රාත් හා වෙනත් කිසියම් පදනමක් මත බඳවා ගන්නා ලද සේවකයින් 11 දෙනෙකු 2013 නොවැම්බර් මස 2013 ජනවාරි 01 සිට ක්‍රියාත්මක වන පරිදි ස්ථිර කර තිබුණි. එකී සේවකයින් වෙනුවෙන් 2013 වර්ෂයේදී සභා අරමුදලින් ගෙවා තිබූ රු.139,320 ක සේවක අර්ථසාධක දායක මුදල සභා අරමුදලට අයවිය යුතු වුවද, 2014 ඔක්තෝබර් 30 දින වන විටද එකී මුදල ආපසු අයකර ගෙන නොතිබුණි.

(ආ) 2013 වර්ෂයේදී වීථි පහන් උපකරණ මිලට ගැනීම සඳහා රු.71,280 ක්ද, වීථි පහන් නඩත්තුකරුට රු.30,300 ක්ද වශයෙන් රු.101,580 ක් ගෙවා තිබුණද 2013 වර්ෂයේදී විදුලි බල මණ්ඩලය විසින් කිසිදු මුදලක් ප්‍රතිපූර්ණය කර නොතිබූ බැවින් මුළු මුදලම සභා අරමුදලට වැය බරක් වී තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේදී බැංකු ජංගම ගිණුම්වලින් මුදල් මාරු කිරීම් කර ගෙන තිබුණද 2013 දෙසැම්බර් 31 දිනට නොපියවූ මුදල් රු.1,229,275 ක් විය.

3.4 මානව සම්පත් කළමනාකරණය

2013 දෙසැම්බර් 31 දිනට සභාවේ සේවක සංඛ්‍යාව පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| තනතුරු වර්ගය | අනුමත | තථ්‍ය | පුරප්පාඩු | අතිරික්ත |
|---|---|---|---|---|
| විධායක | 01 | 01 | | |
| තෘතියික | 01 | 02 | | 01 |
| ද්විතියික | 22 | 19 | 03 | |
| ප්‍රාථමික | 29 | 26 | 03 | |
| වෙනත් (අනියම්,තාවකාලික, කොන්ත්‍රාත්) | - | 05 | | 05 |
| | 53 | 53 | 06 | 06 |

සමාලෝචිත වර්ෂයේ පළාත් පාලන කොමසාරිස් වෙතින් කාර්යය මණ්ඩල වැටුප් හා මන්ත්‍රී දීමනා ලෙස රු.10,144,900 ක් (යතුරුපැදි, ණයවාරික අයකිරීම් සමඟ) මුදලක් ප්‍රතිපූර්ණය කර තිබූ අතර වර්ෂය තුල කාර්ය මණ්ඩල වැටුප් හා දීමනා ලෙස රු.13,041,689 ක මුදලක් වැයකර තිබුණෙන් සමාලෝචිත වර්ෂයේදී සභා අරමුදලට රු.2,896,785 ක අතිරේක වැය බරක් වී තිබුණි.

4. ගිණුම් කටයුතු භාවය හා යහපාලනය

4.1 ක්‍රියාකාරී සැලැස්ම

සභාව ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

4.2 අභ්‍යන්තර විගණනය

සභාවේ ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් පවත්වා නොතිබුණි.

4.3 විගණන හා කළමනාකරණ කමිටු

සභාව විගණන හා කළමනාකරණ කමිටු පිහිටුවා නොතිබුණි.

4.4 ප්‍රසම්පාදන සැලැස්ම

සභාව විසින් සමාලෝචිත වර්ෂය සඳහා 2006 ජනවාරි 25 දිනැති අංක ජී.ප්‍ර.නි./ප්‍ර.වි.නි./18 දරන චක්‍රලේඛයේ 42(ආ) ප්‍රකාරව ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

4.5 අයවැය පාලනය
------------------

සමාලෝචිත වර්ෂය සඳහා ඉදිරිපත් කර ඇති අයවැය ලේඛනය සඵල මූල්‍ය පාලන කාරකයක් ලෙසට යොදා ගෙන නොතිබුණි.

5. පද්ධති හා පාලන
------------------------

පහත දැක්වෙන පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය
(ආ) අයවැය පාලනය
(ඇ) ආදායම් පරිපාලනය
(ඈ) වත්කම් කළමනාකරණය
(ඉ) මානව සම්පත් කළමනාකරණය